**කැකිරාව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

**01 . මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 15 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 24 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කැකිරාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

නගර ශාලාවේ ප්‍රයෝජනය සඳහා මිලදීගෙන තිබුණු රු.884,500 ක් වූ තිරරෙදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

**02. මූල්‍ය සමාලෝචනය**
**------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**
**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.22,904,154 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.9,712,359 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**
**---------------------**

**2.2.1 වරිපනම් බදු**
**-------------**

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබුණු රු.1,597,599 ක්වූ වරිපනම් බදු ආදායමෙන් පසුව වූ අයවීම මත 2016 මාර්තු 31 දින වන විට තවදුරටත් අයවියයුතු මුදල රු.394,003 ක් බව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2016 අප්‍රේල් 29 දින වාර්තා කර තිබුණි.

## 2.2.2 බදුකුලී

-------

සමාලෝචිත වර්ෂය සඳහා රු.313,000 කට බදුදී තිබුණු කැකිරාව මුහුදු මාළු ලැලි අංක 01 න් 2015 දෙසැම්බර් 31 දිනට රු.168,000 ක බදු මුදලක් අයවීමට තිබුණු අතර එම හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සභාවේ නගරශාලාවේ වේදිකාවට රු.884,500 ක්වූ තිරරෙදි මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

(ආ) එකතුව අක්කර 9.75 ක්වූ ඉඩම් 12 ක වටිනාකම රු.43,800 ක් වශයෙන් දක්වා තිබුණු අතර වර්තමාන තක්සේරු අගයන් ලබාගෙන ඉඩම්වල තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 1-3 ත් අතර කාලයක සිට ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති 100 සඳහා ලැබිය යුතු රු.20,673,847 ක් වූ මුදලක් කර්මාන්ත ණයගැති ශේෂය තුළ ඇතුළත්ව තිබුණු අතර එම මුදල අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ඈ) වර්ෂ 1-3 ත් අතර කාලයක සිට ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති 120 සඳහා ගෙවිය යුතු රු.21,730,544 ක්වූ මුදලක් කර්මාන්ත ණයහිමි ශේෂය තුළ ඇතුළත්ව තිබුණු අතර ඒවා නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඉ) එකතුව රු.298,675 ක්වූ ගෙවීම් වවුචර් 11 ක් මුදල් රෙගුලාසි 257 ප්‍රකාරව සහතික කිරීමකින් තොරව ගෙවා තිබුණි.

## 3.2 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

2015 වර්ෂයේදී සභා මන්ත්‍රිවරුන් සඳහා එකක් රු.20,650 ක් බැගින් වූ කාර්යාල ගමන්මළු 15 ක් මිලදී ගැනීමට රු.309,750 ක් වැයකර තිබුණි. කාර්යාල කටයුතු සඳහා මෙවැනි විශාල වටිනාකමකින් යුතු කාර්යාල ගමන්මළු මිලදී ගැනීමේ අවශ්‍යතාවය අනාවරණය නොවුණුඅතර ගමන්මළු 14 ක් පමණක් බෙදාදී තිබුණි.

## 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------

කැකිරාව ප්‍රාදේශීය සභාව විසින් දෛනිකව විශාල කසල තොගයක් එකතු කරනු ලබන නමුත් කසල ප්‍රතිචක්‍රීකරන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් පාරිසරික ගැටලු මතුවීමේ තත්ත්වයක් පැනනගිමින් පවතින බව නිරීක්ෂණය විය.

**3.4 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**නිශ්ක්‍රීය වත්කම්**

**------------------**

සභාව සතු රු. 3,198,000 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂය තුළදී භාවිතයට නොගැනීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි.

**04. පද්ධති හා පාලනය**

**----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ණයගැති /ණයහිමි පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) සන අපද්‍රව්‍ය කළමනාකරණය